10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

## ප්‍රජාතන්ත්‍රවාදී පාලනය




අන්තර්ගතය - A M R W S අමරතුංග - ගුරු උපදේශක - රත්නපුර අධ්‍යාපන කලාපය
සැකසුම - P G W ගුණතිලක - බප/කළු/ හිනටියාගල සිරි සීවලි මහා විද්‍යාලය , කළුතර

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## නිපුණතාව 10.1 : -

ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියකු ලෙස කටයුතු කරයි.

## ප්‍රජාතන්ත්‍ර වාදය 10.1.1 : -

මිනිසා ඈත අතීතයේ සිටම තම අවශ්‍යතා සපුරා ගනු ලැබුයේ සාමූහිකව ජීවත් වීම තුලිනි. ගෝත්‍රික වශයෙන් වෙන්ව ජීවත් වූ මිනිසා තම අවශ්‍යතා වැඩිවීමත් සමග සාමූහිකව කටයුතු කරන්නට පෙළඹුණි. රාජාණ්ඩු ක්‍රමය රදළ ආණ්ඩු ක්‍රම වල තිබූ අඩුපාඩු මගහරවා ගැනිම තුලින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් නිර්මාණය විය.



වර්තමාන ලෝකයේ බෝහෝ රටවල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පිළිගෙන ඇත. ශ්‍රී ලංකාවද එම රටවල් අතරට එකතු වේ.



## ආරම්භය හා ඉතිහාසය :

- ග්‍රීසියේ ඇතැන්ස් නුවර පෞර රාජ්‍යයේ පාලනය ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙන ඇත.
- පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වනුයේ පුරවැසි සභාවයි.
- පුරවැසි සභාවේදි පාලන කටයුතු සඳහා පුරවැසියන්ගේ කැමැත්ත සෘජුවම සලකා ඇත.
- කාන්තාවන්ට, වහලුන්ට, විදේශකයන්ට මෙම අවස්ථාව ලබා දී නැත.
- මෙයින් පැහැදිලි වන්නේ තීන්දු තිරණ ගැනිමේදි ජනතාවගේ මතය විමසිමේ ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයක් වන බවයි.

## ඒබ්‍රහම් ලින්කන්



ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වාගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි.

## සීලර්



සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍ර වාදයයි.

මෙම සියලුම මත වලින් පෙනී යන්නේ ප්‍රජාතන්ත්‍රවාදය යනු ජනතාවාදි පාලන ක්‍රමයක් වන බවය.

ප්‍රජාතන්ත්‍ර වාදය

සෘජු ප්‍රජාතන්ත්‍රවාදය

වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය
(නාමයෝජිත ප්‍රජාතන්ත්‍රවාදය)

**<u>සෘජු ප්‍රජාතන්ත්‍රවාදය</u> : -**

**රටක ජනතාව එක් ස්ථානයකට රැස් වී ජනතා ගැටළු සාකච්ඡා කර සියලු දෙනාගේ කැමැත්ත මත විසඳුම් සොයා ගන්නා ක්‍රමයකි. මේ සඳහා,**

- **විශාල භූමියක් අවශ්‍ය වීම.**
- **ජනගහණය සීමා සහිත වීම.**
- **අවශ්‍යතා සංකීර්ණ නොවීම.**
- **ජනගහණය රැස්කර ගත හැකි වීම.**
- **අදහස් පරස්පර නොවීම.**

වැනි අවශ්‍යතා සම්පූර්ණ විය යුතුය.

මේවා විවිධ ගැටළු ඇති කරනු ඇත. එම ගැටළු වලට විසඳුම් සෙවීමේ දී වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය බිහි විය.

## වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය : -

මහජනතාවගේ නියෝජිතයින් මගින් ගැටළු වලට විසඳුම් සොයා ගැනීමේ ක්‍රමයයි. මුලින්ම මෙය යුරෝපය තුළ ක්‍රියාත්මක වී ඇත. මෙය වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය දක්වාම වැඩි දියුණු වී ඇත.

- වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල ඇතැම් ගැටළු සඳහා විසඳුම් සෙවීමේදී සෘජු ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමය භාවිතා වන අවස්ථාවකි **ජනමත විචාරණය**

ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

- මහජනතාවගේ කැමැත්ත මත ක්‍රියාත්මක වේ.
- බලය හිමි වන්නේ ජනතාවගේ කැමැත්තේන් වැඩි නියෝජිත පිරිසක් අයත් පක්ෂයට හෝ කණ්ඩායමටය.
- නීති සම්පාදනයේ දි නියෝජිතයන්ගේ බහුතර කැමැත්ත මත සිදුවේ.

## ක්‍රියාකාරකම : -

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සංවර්ධනය සඳහා හිතකර වේ යන මැයෙන් විවාදයක් පැවැත්වීම.

## ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ලක්ෂණ

- ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රියාකාරකම් වලට එළඹේ.
- සාකච්ඡා මගින් තීරණ වලට එළඹේ.
- ඡන්ද බලය මත පාලකයන් හා ආණ්ඩුව තේරීම.
- තරඟකාරි පක්ෂ ක්‍රමයක් පැවතීම.
- ඡන්ද කොට්ඨාස ක්‍රමය
- නිදහස් හා සාධාරණ මැතිවරණ
- අන් මත ගරු කරයි.
- ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් පැවතීම.
- සමානාත්මතාව ක්‍රියාත්මක කිරීම.

රටක නිශ්චිත වයස් සීමාවන් ඉක්මවූ පුරවැසියන්ට

- ජන වර්ගය
- ස්ත්‍රී පුරුෂ බව
- රැකියාව
- ආදායම
- කුල වාදය

නොසලකා ඡන්ද බලය හිමිවේ. මෙය සර්ව ජන ඡන්ද බලයයි.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව රජයේ පරමාධිපත්‍යය ජනතාව මත පිහිටා ඇත.



**ක්‍රියාකාරකම : -**



රටක දේශපාලන පක්ෂ හා කණ්ඩායම් රාශියක් පවතින විට ප්‍රජාතන්ත්‍රවාදය හොඳින් ක්‍රියාත්මක වේ. තරගකාරි පක්ෂ ක්‍රමය මේ සඳහා හේතු වේ.

රටක ක්‍රියාත්මක වන පක්ෂ සංඛ්‍යාව අනුව

- බහු පක්ෂ ක්‍රමය
- ද්වි පක්ෂ ක්‍රමය
- ඒක පක්ෂ ක්‍රමය

ලෙස ප්‍රභේද කළ හැකිය.

දේශපාලන පක්ෂ රාශියක් ක්‍රියාත්මක වන විට එය බහු පක්ෂ ක්‍රමයක් සේ සැලකේ.

උදා : - **ඉන්දියාව**
**ශ්‍රී ලංකාව**

**පක්ෂ දෙකක් පමණක් ක්‍රියාත්මක වන විට එය ද්වි පක්ෂ ක්‍රමය සේ සැලකේ.**

උදා : - චීනය
රුසියාව
කියුබාව

රටක් තුළ පක්ෂ ක්‍රමයක් පවතින විට ඒ ඒ පක්ෂ අතර තරගයක් නිර්මාණය වේ. ඒ තුළින් වඩාත් යහපත් ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප භුක්ති විඳිමට ජනතාවට මග පැදෙනු ඇත.

ඒ මත තරගකාරි පක්ෂ ක්‍රමයක් සැමවිටම,

- ජන මතයට ඉඩ සලසයි.
- ඒකාධිපති පාලනයක් බිහි නොකරයි.
- අහිතකර ප්‍රතිපත්ති විවේචන මගින් හිතකර තත්වයට පත්කර ගත හැකිවේ.
- සමාජයේ විවිධත්වය නිරූපණය කිරිමට අවස්ථාව සැලසේ.
- විවිධත්වය තුලින් ඒකීයත්වය නිර්මාණය කරයි.

## ක්‍රියාකාරකම : -

වගුව සම්පූර්ණ කරන්න.

| තරගකාරි පක්ෂ ක්‍රමයක වාසි | තරගකාරි පක්ෂ ක්‍රමයක අවාසි |
|---|---|
| | |
| | |
| | |
| | |